ගැමි ජනතාවත්, ගැමි පරිසරයත් පදනම් කොට ගෙන මුළු ආර්ථික දේහයේම සමෘද්ධිමත් භාවයක් ඇති කිරීම ග්‍රාමීය මට්ටමේ සංවර්ධන යෝජනා ක්‍රමවල අරමුණය.

# ගම හැදුණොත් රටත් හැදෙයි

සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය වික්‍රම වීරසූරිය විසිනි.

ගත වූ වසර කිහිපය ඇතුළත ග්‍රාමීය සංවර්ධනයත්, ඒ මගින් වැඩි වැඩියෙන් රැකියා සැපයීමත් සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග ගැන අවබෝධයක් ලබා ගැනීමට ඔබ කැමති ඇතැයි කල්පනා කරමු. රජයේ සංවර්ධන වැඩ පිළිවෙළේ පළමුවැනි, දෙවැනි සහ තෙවැනි අවස්ථා සියල්ලම සංවර්ධනයත් සමගම රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග වියයුතු බව මූලික ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇත. රැකියා පහසුකම් සැලසීම සඳහා සංවර්ධනය කිරීම රට තුළ දැනට පැහැදිලිව පෙනෙන ලක්ෂණයකි. මෙම වැඩ පිළිවෙළ නගරයට පමණක් සීමා නොවී ග්‍රාමීය ප්‍රදේශ කරා ද පැතිර ගොස් ඇත.

ශ්‍රී ලංකාව ප්‍රමාණයෙන් ඉතා කුඩා වුව ද, සංවර්ධනය වන රටවල් අතර මුල් පෙළේ සිටින රාජ්‍යයකි. රටේ සංවර්ධනය සඳහා නා නා විධ මට්ටමින් ආධාර, අනුබල සපයන රාජ්‍යයන් හා වෙනත් ආයතන ද බෙහෙවින් වැඩි වී තිබෙන බව ප්‍රකට කරුණකි. මීට පෙර කිසිදක නොවූ පරිදි මෙරට සංවර්ධන ව්‍යාපාර උදෙසා විදේශ රටවල් මෙන් ම ආයතන ද විශාල උද්යෝගයක් දක්වන බව පැහැදිලිවම පෙනෙන්ට තිබේ.

දිවයිනට සර්ව ජන චන්ද බලය ලැබී අඩ සිය වසක් සපිරෙන මේ අවස්ථාවේ ග්‍රාමීය මට්ටමේ සංවර්ධන කටයුතු විශේෂයෙන් කැපී පෙනෙන්නකි. දේශපාලන බලය ජනතාව වෙත පැවරී ගෙවී ගිය කාලය ඇතුළත රටේ ග්‍රාමීය මට්ටමින් ඇති වූ පරිවර්තනය, නිදහස් අධ්‍යාපනයත් නිසා වඩාත් ආලෝකමත් විය. වර්තමානයේ රාජ්‍ය තාන්ත්‍රයේ විවිධ ක්ෂේත්‍රයන්හි නොයෙකුත් තනතුරු දරන පුද්ගලයින් පමණක් නොව, රටේ අතිකුත් ක්ෂේත්‍රයන්හි උසස් තනතුරු දරන පුද්ගලයන් ද අතුරින් බොහොමයක් ම ගම්බද ප්‍රදේශවලින් පැමිණි අය වෙති.

වර්තමානයෙහි පාසැල් හැර යන වයසේ පසුවන අය ගේ ප්‍රමාණය වැඩි වී ඇති අතර, මේ අය විශාල වශයෙන් යැපෙන්නවුන් ගේ සනයට වැටෙති. ගමේ සිට නගරයට ඇදී එන අය ගේ ප්‍රමාණය ද මේ අනුව වැඩිවෙමින් පවතින අතර, ඔවුන් ගමේ ම රඳවා ගැනීම සඳහා ග්‍රාමීය පෙදෙස්වල රැකියා පහසුකම් වැඩි වැඩියෙන් ඇති කිරීමටත්, සංවර්ධන ව්‍යාපාර විධිමත් කිරීමටත් අවශ්‍ය වෙයි.

## ගමට තැන

මෙරට නිෂ්පාදන ක්‍රියා වලියෙහි මුල ග්‍රාමීය මට්ටම ය. ග්‍රාමීය මට්ටමෙහි ක්‍රියාකාරිත්වය උදෙසා සැපයිය හැකි සෑම පහසුකමක්ම සැපයීම කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබේ. ඒ සඳහා මහා මාර්ග, ගමනා ගමන, සෞඛ්‍ය, විදුලි බලය, ආදී පහසුකම් වැඩි වැඩියෙන් ඇතිකර ගෙන යනු ලැබේ. ග්‍රාමීය මට්ටමේ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා විදුලි බලය සපයා ගැනීමේ ඉඩ කඩ පුළුල් කර ඇති අතර ගමට විදුලි බලය ලැබීම නිසා එහි සංවර්ධනයට හොඳ වටපිටාවක් සැකසී තිබේ. මෙවැනි මූලික පහසුකම් වැඩි දියුණු කිරීමෙන් ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ක්‍රියා වලියෙහි වේගවත් පරිවර්තනයක් ඇති වීමට කටයුතු සලසා ඇත.

මෙරට කෘෂිකාර්මික හා වැවිලි අංශවල මුල් තැනක් ලැබෙන්නේද ග්‍රාමීය ප්‍රදේශවලටය. මෙම අංශවල සංවර්ධනය සඳහා ගනු ලබන නානා විධ

ක්‍රියා මාර්ග අතරට නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස යෙද වූ ප්‍රතිකර්ම ද වේ. වාරිමාර්ග පහසුකම් ව්‍යාප්ත කිරීම, පෝර වැනි අත්‍යාවශ්‍ය සැපයීම් බෙද හැරීම සඳහා පවතින බාධා ඉවත් කිරීම ආදී පියවර රැසක් මේ සඳහා ගෙන ඇත.

රජයේ සංවර්ධන ව්‍යාපාර අතුරෙන් ප්‍රමුඛත්වය ලැබී ඇති මහවැලි කඩිනම් ව්‍යාපාරයට මුළුමනින් ම පාහේ අයත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශය ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම ප්‍රදේශ කරා සංවර්ධන උණුසුම පැතිර යමින් පවතී.

'ගම් උදව' වැනි අළුතින් ගම් පිහිටුවීමේ ව්‍යාපාර මගින් ද ග්‍රාමීය මට්ටමේ විශාල ප්‍රබෝධයක් දක්නට ලැබේ. නිවාස හා වෙනත් ඉදි කිරීම් කටයුතු දිවයිනේ අස්සක් මුල්ලක් නැර විහිදී පැතිරී ගොස් ඇති සැටි දිවයිනෙහි කවර ප්‍රදේශයකට වුවද යන කෙනකුට ඇස් පනාපිට දක ගත හැකිය.

මීට අමතරව, කඩදසි, සිමෙන්ති ආදී කර්මාන්ත ද, ගම්බද අමු ද්‍රව්‍ය ආශ්‍රිතව ආරම්භ කළ හැකි වෙනත් කර්මාන්ත ද, පෙර වඩා දිවයිනේ ගම්බද ප්‍රදේශ කරා ගෙන යාමට පියවර ගෙන තිබේ.

විමධ්‍යගත අයවැය ක්‍රමය යටතේ සෑම මැතිවරණ කොට්ඨාශයක් සඳහා ම නානා විධ සංවර්ධන කටයුතු උදෙසා වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණයන් අධ්‍යාපනය, සෞඛ්‍යය, මාර්ග, කර්මාන්ත, නිවාස ආදී ජනතා අවශ්‍යතා රාශියක් සපුරා ගැනීම පිණිස යොදවනු ලැබේ. විමධ්‍යගත අය වැය ක්‍රමය යටතේ මුදල් වෙන් කෙරෙන්නේ රජයේ වෙනත් සංවර්ධන වැඩ කටයුතු සඳහාත්, ඒ ඒ දෙපාර්තමේන්තුවලට අදළ අනිකුත් කටයුතු සඳහාත් වෙන් කරනු ලබන මුදල්වලට අමතරව ය. පොදු අවශ්‍යතා විමසා බලා සංවර්ධන සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට මෙමගින් ඉඩකඩ සැල සෙන අතර, එමගින් එක් එක් ප්‍රදේශවල සංවර්ධන අවශ්‍යතා රාශියක්ම සපුරා ගැනීමට අවස්ථාව ලැබේ. ගමක ඕනෑ එපාකම් දන්නේ ගැමියන් ය. ගැමි මට්ටමේ සංවර්ධනය තකා වැඩි ප්‍රයෝජනයක් මේ ක්‍රමයෙන් සලසා ගැනීමට පුළුවන.

**ගමෙන් රටට**

රජයේ සංවර්ධන ව්‍යාපාර අතුරෙන් තවත් කැපී පෙනෙන ව්‍යාපාරයකි, දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළ. මේ යටතේ දැනටමත් දිස්ත්‍රික්ක ගණනාවක් සංවර්ධනය කිරීමට මූලික කටයුතු යොද ඇති අතර, කිහිපයක වැඩ කටයුතු දැනටමත් අරඹා තිබේ. ග්‍රාමීය මට්ටමේ පොදු අවශ්‍යතා කාලෝචිත ලෙස රටේ නිෂ්පාදන ප්‍රගතිය උදෙසා පොදුවේ පසුබිම් කර ගත් විට එමගින් ප්‍රදේශයටත්, රටටත් සැලසෙන ප්‍රයෝජන අවසානයේ මුළුමහත් ජනතාව කෙරෙහි බලපාන්නේ ය, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම ක්‍රියාත්මක කරනු ලබන්නේ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර ආයතන මගින් ද, නෝර්වේ, ස්වීඩනය වැනි රාජ්‍යයන් මගින් ද, ශ්‍රී ලංකාවට සැපයෙන ආධාර මත ය. මෙම සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ ඒ ඒ ප්‍රදේශවල අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන කෘෂිකාර්මිකය පහසුකම් සැලසීම, බීම සඳහා ජලය සැපයීම, වැව් ප්‍රතිසංස්කරණය හා නවීකරණය, අළුත් වාරිමාර්ග පද්ධතියක් ඇති කිරීම, සෞඛ්‍ය, අධ්‍යාපන, මහා මාර්ග ආදී පහසුකම් ඇති කිරීම, ධීවර කර්මාන්තය, සුළු අපනයන බෝග වගාව නැංවීම, නැවත වන වගාව ආදි කටයුතු රැසක් ඉටු කෙරේ.

ග්‍රාමීය මට්ටමේ රැකියා පහසුකම් බහුල කිරීමෙන් ගමේ සිට නගරයට ඇදී ගෙන එන තරුණ කොටස් ගමේ ම නතර කර ගැනීමට හැකි වේ. ගැමි ජනතාවත්, ගැමි පරිසරයත්, පදනම් කොට ගෙන මුළු ආර්ථික දේහයේ ම සමෘද්ධිමත් භාවයක් ඇති කිරීම ග්‍රාමීය මට්ටමේ සංවර්ධන යෝජනා ක්‍රමවල අරමුණ ය. ගම සංවර්ධනය වූ කළ නිරායාශයෙන් ම රටේ සංවර්ධනය ද ඇති වේ.

(ග්‍රාමීය රැකියා වියුක්තිය අළලා 'මාර්ග' ආයතනයේ පැවති ආසියානු කලාපීය සමුලුවකදී කරන ලද දෙසුමක් ඇසුරෙන් සකස් කෙරිණි.)